# දරුවන් උදෙසා බයිබලයක්



# රූත්: ප්‍රේම කතාවක්

**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Janie Forest
Alastair Paterson

**සකස්කරන්නා:** Lyn Doerksen

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**



ඔබට ඔබේ මුතුන් මිත්තන්, ඔවුන්ගේ දෙමාපියන් සහ ඔබේ පවුලේ ඔබට පෙර පැමිණි සියලු දෙනා හමුවීමට ඔබට හැකිවේ නම්, ඔවුන් කෙබඳු පුද්ගලයන්දැයි දැන ඔබ පුදුම වනු ඇත. ශු. බයිබලයට අනුව, ජේසුස් වහන්සේගේ මුතුන් මිත්තන්ගෙන් කෙනෙක් වූයේ රූපවලට නමස්කාර කළ මෝවබ් ජාතික කාන්තාවක් වූ රූත් ය.




රූත්ගේ කතාව ඊශ්‍රායලයේ ආරම්භ වන්නේ සැම්සොන්ගේ
කාලයෙන් පසුව, දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේ
කෙරෙහි විශ්වාසය තැබීම සහ කීකරු වීම නැවැත්වීමත්
සමඟය. දරුණු සාගතයක් දේශයට පහර දුන්නේය.
සාගතයක් යනු කුමක්දැයි ඔබ දන්නවාද?
සාගතයක් යනු පලතුරක් හෝ භෝගයක්
හෝ නොවැඩෙන කාලයක් හා ඒ නිසාම
සතුන් සහ සමහරවිට මිනිසුන් පවා
කුසගින්නෙන් මිය යන කාලයකි.
3


එලිමෙලෙක් නම් මිනිසෙක් තම බිරිඳ සහ පුතුන් දෙදෙනා
සමඟ බෙත්ලෙහෙම් නුවරින් පිටත් වී ආහාර සොයමින්
ගියේය. ඔහු ගියේ පිළිමවලට නමස්කාර කරන මිනිසුන්
සිටින මෝවබ් දේශයටයි.
4


මෝවබ්හිදී
එලිමෙලෙක් සහ
ඔහුගේ පවුලේ අයට යහපත් දෙයක්
සිදුවූයේ නැත. ඔහු මිය ගිය අතර පසුව
ඔහුගේ පුත්‍රයෝ දෙදෙනාද මිය ගියෝය.
ඔහුගේ බිරිඳ
වූ නයෝමි,
කිලියොන්
එලිමෙලෙක්
මාලොන්
පුතුන්ගේ භාර්යාවන් දෙදෙනා වන රූත්
සහ ඕර්පා සමඟ තනි වූවාය. ඒ තරුණියෝ
දෙදෙනාම මෝවබ් ජාතිකයන් වූවෝය.
5


දැන් වැන්දඹුවක් වූ නයෝමි, ස්වාමින් වහන්සේ තම
සෙනඟ වෙතට නැවත පැමිණි බවද, ඔවුන්ට ආහාර දෙන
බවද අසා දැනගත්තාය. ඇය නැවත සිය
මව්බිමට යාමට තීරණය කළාය. නමුත්
තරුණියන් දෙදෙනා කුමක් කරාවිද?
නයෝමි ඔවුන්ට
උපදෙස් දුන්නේ
මෝවබ්හි නැවතී
නැවත විවාහ
වන ලෙසය.
6


ඕර්පා නැවත ඇයගේ පවුල වෙත
ගියාය. නමුත් රූත්, යෑම ප්‍රතික්ෂේප
කළාය. ඒ වෙනුවට, රූත් තම
නැන්දම්මාව අත් නොහරින බවට
පොරොන්දු වෙමින් සුන්දර කවියක්
පැවසුවාය.
7


නයෝමිගේ පැරණි මිතුරෝ
ඇය බෙත්ලෙහෙමේ නිවසට
පැමිණීම ගැන සතුටු වූවෝය.
නමුත් “නයෝමි” (ප්‍රසන්න)
වෙනුවට ඇයව “මාරා” (තිත්ත)
ලෙස හඳුන්වන ලෙස ඇය
ඔවුන්ගෙන් ඉල්ලා සිටියාය.
“මක්නිසාද සියලු බලවන්ත
දෙවිඳුන් මා සමඟ ඉතා කටුක
ලෙස කටයුතු කර ඇතැ” යි
ඇය පැවසුවාය. නයෝමි
කිසිවක් නොමැතිව ආපසු
පැමිණ ඇත. ඇයට ඉතිරි වූයේ
රූත් පමණි.
8



මෝවබ්හි බොහෝ මිනිසුන් මෙන් රූත් පිළිමවලට නමස්කාර කර තිබුනද, ඇය ඒ පිළිම අතහැර ඊශ්‍රායෙල්හි ජීවමාන දෙවියන් වහන්සේට නමස්කාර කළාය. නයෝමි හට කෑම ප්‍රමාණවත් ලෙස ලැබෙන පිණිස රූත් වෙහෙස මහන්සි වී වැඩ කළාය. සෑම දිනකම ඇය කෙතේ ගොයම් කපන්නන් පසුපස ගොස් ඉතිරි වූ ධාන්‍ය අහුලා ගත්තාය.

9



රූත් ඇයගේ නැන්දම්මාට කොතරම් හොඳින් සළකන්නේදැයි කෙතේ අයිතිකරු වූ බෝවස් දැනගත්තේය. ඔහු ඇයව මුණගැසුණු විට, බෝවස් ධාන්‍ය මිටක් හිතාමතාම ඉතිරි කරන ලෙස තම අස්වනු නෙළන්නන්ට නියෝග කරමින් ඇයට උපකාර කළේය. බෝවස් රූත්ට කැමති වූයේය.

10



බෝවස් සහ ඔහුගේ කරුණාව ගැන රූත් නයෝමිට පැවසූ විට, මහළු කාන්තාව දෙවියන් වහන්සේට ප්‍රශංසා කළාය. “ඒ මනුෂ්‍යයා අපේ නෑදෑයෙක්, අපේ ළඟම ලේ නෑයෙක්.” ඇය පැවසුවාය.

11



කාලය ගෙවී යත්ම, බෝවස් හට රූත් සමඟ විවාහවී, නයෝමි සහ ඇගේ පවුලට අයත් ඉඩම බලා ගැනීමට අවශ්‍ය වූයේය. නමුත් ඒ සඳහා පළමු අවස්ථාව ලැබුණේ වෙනත් ළඟම ඥාති,යෙකුටය. ඒ මනුෂ්‍යයාට ඉඩම අවශ්‍ය වුවත් බිරිඳ ලෙස රූත් අවශ්‍ය නොවීය. නමුත් ඔහුට එක් දෙයක් නොමැතිව අනෙකක් තිබිය නොහැකි බව නීතියේ සඳහන් විය.

12

ඒ දවස්වල ගනුදෙනුවක් බේරගන්නා පිණිස මිනිස්සු අතට අත නොදුන්නෝය. බෝවස් සෙරෙප්පුවක් ගලවා එය අනෙක් මනුෂ්‍යයාට ප්‍රසිද්ධියේ දුන්නේය. ගනුදෙනුව සමථයකට පත් විය. රූත් දැන් ඔහුගේ බිරිඳ වනු ඇත. දැන් ඇය සහ නයෝමි බෝවස්ගේ පවුලේ සමාජිකයෝ වන්නෝය.



13



බෝවස් සහ රූත් ඔවුන්ට ලැබුනු පළමු දරුවා, ඔබෙද් ලෙස හැඳින්වූවෝය. ඔහු ඊශ්‍රායෙල්හි ශ්‍රේෂ්ඨ රජ වූ දාවිත්ගේ සීයා වූයේය.

14

නමුත් ඊටත් වඩා සන්තෝෂදායක කරුණක් වූයේ, ඔබෙද් ළදරුවා ස්වාමි වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මුතුන්මිත්තෙකු වීමය. රජුන්ගෙත් රජු සහ ලෝකයේ ගැළවුම්කරුවා වීමට ජේසුස් වහන්සේ පැමිණියේ දාවිත්ගේ පෙළපත හරහාය.






රූත්: ප්‍රේම කතාවක්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

රූත්

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130



# අවසානය

16

60



**මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සැදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.**

**දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.**

**මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.**

**ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජිවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජිවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජිවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.**

**දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)**